Sri Lanka Journal of Co-operative studies, Volume 02, Issue 01, 2022
ISSN- 2579-1745, pp. 43–58.

විවිධ සේවා සමුපකාර සමිතියක භෞතික හා මානව සම්පත් උපයෝජනය පිළිබඳ පර්යේෂණාත්මක සිද්ධි අධ්‍යනය (සීමා සහිත නා උල විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරින්)

ආර්. බෝධිපක්ෂ[1]
ආරියරත්න හේරත්[2]

[1] සමුපකාර සංවර්ධන නිලධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
[2] මහාචාර්ය, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

සංක්ෂේපය

විවිධ සේවා සමුපකාර සමිතියක භෞතික හා මානව සම්පත් උපයෝජනය කිරීම පිළිබඳව පරික්ෂා කිරීම මෙම පර්යේෂණයේ දී සිදුකර ඇත. පර්යේෂණය සිදුකර ඇත්තේ පුළුල් අධ්‍යයන ක්ෂේත්‍රයක් මත සිට නොව පටු භූගෝලීය කලාපයක් කේන්ද්‍රගතවයි. අධ්‍යයනයේ දී සහභාගීත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා හා වෘත්තීය අත්දැකීම් ද උපයෝගී කරගෙන ඇත. සාහිත්‍යය විමර්ෂණය මඟින් ආර්ථිකය තුළ ඇති සම්පත් හඳුනාගැනීමත් එම සම්පත් සමුපකාර ව්‍යාපාරය තුළ උපයෝජනය වන ආකාරයත් හඳුනාගෙන ඇත. දත්ත විශ්ලේෂණය ඔස්සේ විවිධ සේවා සමුපකාර සමිති සතු සම්පත් හඳුනාගැනීමත්, එම සම්පත් සමුපකාර ව්‍යාපාරය තුළ දැනට උපයෝජනය කරන ආකාරය නිවැරදි ද යන්නත් පිළිබඳව විශ්ලේෂණය කිරීමත් සිදුකර ඇත. මෙම දත්ත විශ්ලේෂණය මඟින් නිගමනය වන්නේ විවිධ සේවා සමුපකාර සමිති තමන් සතු භෞතික හා මානව සම්පත් උපයෝජනය සමිතිවල ඵලදායීතාවය හා තිරසාර සංවර්ධනය ඇතිවන ආකාරයට සිදුනොවන බවයි. කාලය, මෙම පර්යේෂණයේ දී ප්‍රධාන වශයෙන් සීමා වූ අතර සමුපකාර ව්‍යාපාරය තුල තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට ඉවහල් වන ප්‍රතිපත්තිමය ගම්‍යවීම් කිහිපයක් ද පර්යේෂණය තුළින් හඳුනාගෙන සටහන් කර ඇත. ඒ අතුරින් නව්‍යතා බිහිකිරීම, නව ව්‍යාපෘති ආරම්භ කිරීම, ප්‍රතිවක්‍රීකරණයට හුරුවීම, මානව සම්පත පුහුණු කිරීම, ආකර්ෂණීය මිල ක්‍රම හඳුන්වා දීම, නව තාක්ෂණය භාවිතා කිරීම වැනි කරුණු දැක්විය හැක.

මූල පද : *භෞතික සම්පත්, මානව සම්පත්, කාර්යක්ෂමතාවය*

1. හැඳින්වීම

ජන සමාජය ආරම්භයේදීම ස්ථාපිත මූලික සමාජ සංස්ථාවක් වශයෙන් සමුපකාරය හඳුනාගත හැකිය. විවිධ සාමාජික කොටස් ඒකරාශි වූ සමාජ ප්‍රගතිය අරමුණු කරගත් ජීවන ක්‍රමයක් වන මෙම සමුපකාර ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයට ඇතුළු වූයේ විසිවන සියවසේ මුල් භාගයේදීය. (සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව දකුණු පලාත, 2020). 1911 වර්ෂයේ මැයි 05 දින "ක්‍රොෆඩ් කමිටු" නිර්දේශය අනුව සමුපකාර ණය දෙන සමිති ආඥා පනත ලියාපදිංචි වීම සිදුවිය. එතැන් සිට ගොවිතැන් ආශ්‍රිතව සමුපකාර ව්‍යාපාරයේ උපත සටහන් කළ හැකිය. 1957 වර්ෂයේදී එකම වහලක් යටින් සියළු සේවා සැපයීම සඳහා වන විවිධ සේවා සමුපකාර සමිති ආරම්භ කරන ලදී. තවද, ශ්‍රී ලංකාවේ ප්‍රථම ග්‍රාමීය බැංකුව 1964 වර්ෂයේදී මහනුවර මැණික්හින්නේදී ආරම්භකර ඇත. සමුපකාර ව්‍යාපාරය ජාත්‍යන්තර තලයේදී ලබා ඇති සාර්ථකත්වය හා සංසන්දනය කරන විට ශ්‍රී ලාංකික සමුපකාර ව්‍යාපාරයේ සාර්ථකත්වය පිළිබඳ නැවත සලකා බැලිය යුතුව ඇත. ශ්‍රී ලාංකික සමුපකාර ව්‍යාපාරය තවමත් සාම්ප්‍රදායික රාමුවතුල සිරවී, එහි ශක්තිය හා හැකියාවන් පිළිබඳ අනවබෝධයෙන් සිටී. (බුලත්ගම, 2014). අනෙක් අතට, අප රටේ සමුපකාර ව්‍යාපාරය මූල්‍ය ශක්තිය අතින්ද සාමාජිකත්වයේ පැතිරීම හා සංවිධාන ජාලය අතින්ද අන් සියලු ස්වේච්ඡා සංවිධානයන් සමඟ සමකල නොහැකි තත්වයක පවතී. නමුත් සාමාජිකයන්ගේ ආර්ථික හා සාමාජීය ප්‍රශ්න විසඳීමට ප්‍රමාණවත් දායකත්වයක් සැපයීමට සමුපකාර සමිති වර්තමානයේ අපොහොසත්ව පවතින බව දැකිය හැකිය. සෑම ආයතනයක් සතුවම භෞතික සම්පත් හා මානව සම්පත් පවතී. මෙම සම්පත් සීමාසහිත වේ. මෙම සීමාසහිත වූ භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන ආයතන භාණ්ඩ නිෂ්පාදනය කිරීමත් සේවා සැපයීමත් කරනු ලැබේ. නමුත් සාමාජිකයන්ගේ ආර්ථික හා සාමාජීය ප්‍රශ්න විසඳීමට ප්‍රමාණවත් දායකත්වයක් සැපයීමට සමුපකාර සමිති වර්තමානයේ අපොහොසත්ව පවතින බව දැකිය හැකිය. සමුපකාර ව්‍යාපාරය සතු සම්පත් (දේපල), අන්ධයාගේ දේපල ලෙස වෙනත් පාර්ශව බුක්තිවිඳීම දැකගත හැකිය. (අබේසිංහ, 2011). නිෂ්පාදන සම්පත්, ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් වශයෙන් ප්‍රධාන වශයෙන් වර්ග කළ හැකිය. ආර්ථික සම්පත් සඳහා මිලක් පවතී විකල්ප ප්‍රයෝජන ඇත. එම නිසා ආවස්ථික පිරිවැයක් ඇත. මෙම සම්පත් අසීමිත වුවමනාවන්ට සාපේක්ෂව සැපයුම සීමාසහිත වේ. ආර්ථික සම්පත් වල මූලික ලක්ෂණය හිඟකමයි. ආර්ථික නොවන සම්පත් වල ප්‍රධාන ලක්ෂණය වන්නේ විකල්ප ප්‍රයෝජන නැත, තේරීමක් නැත, හිගකම නැත, ආවස්ථික පිරිවැයක් නැත. නිෂ්පාදන සම්පත් ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, ශ්‍රමය, භූමිය ලෙස කොටස් හතරකට වෙන් කළ හැකිය. (වීරසුන්දර, 1996). තවදුරටත් සඳහන් කරන විට භාණ්ඩ නිෂ්පාදනයේ දී හා සේවා සැපයීමේදී යොදා ගන්නා සම්පත් නිෂ්පාදන සම්පත් වේ. ආර්ථික සම්පත් මෙන්ම ආර්ථික නොවන සම්පත් වලින් ද නිෂ්පාදන සම්පත් සමන්විත වේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ විවිධ සේවා සමුපකාර සමිති 306 ක් පමණ ක්‍රියාත්මක වෙයි. එම සමිති වල සමස්ත සාමාජික සංඛ්‍යාව 6,303,306 ක් පමණ වේ. මෙම සමිතිවල සේවා නියුක්තිය 27,538 පමණ වේ. (සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, 2017). මෙම විවිධ සේවා සමිති සතුව ප්‍රාදේශික වෙළඳසැල්, තොග ගබඩා, කෝප්සිටි, මිනි කෝප්සිටි, ඉන්ධනහල්, අවමංගල්‍ය සේවා, ග්‍රාමීය බැංකු ශාඛා හා වාහන වැනි විශාල සම්පත් ප්‍රමාණයක් පවතී. සමුපකාර ක්ෂේත්‍රයෙන් ජාතික නිෂ්පාදනයට සැළකිය යුතු දායකත්වයක් දක්වයි. වර්තමානයේ පවතින කොවිඩ් - 19 අර්බුදකාරී අවස්ථාවල ජන ජීවිතය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහාත් වෙළඳපලේ භාණ්ඩවල මිල පාලනයක් පවත්වා ගැනීමටත් අවශ්‍ය

අවස්ථාවල වී මිල දී ගැනීම, සහල් සීනි වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පාලන මිලට ජනතාවට ලබාදීම වැනි කටයුතු සඳහා සමුපකාර සමිති මගින් ලැබෙන පිටුවහල ඉතා විශාල වේ. රජයේ ප්‍රතිපත්ති හා අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමට සමුපකාර ව්‍යාපාරය සැම විටම රජයට අවශ්‍ය සහාය ලබා දේ. විවිධ සේවා සමුපකාර සමිති තමන් සතු සම්පත් නිසි පරිදි උපයෝජනය කර තිබේද සමුපකාර සමිති වලට වර්තමානයේ පවතින තරගකාරී ආර්ථික රටාව තුළ තරගකාරීත්වයට මුහුණ දීම සඳහා පවතින භෞතික හා මානව සම්පත් උපයෝජනයෙදී සමිති වල දූර්වලතා හේතුවී තිබේ ද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කරනු ලැබේ. මෙම අධ්‍යනයේ පර්යේෂණ ගැටළුව වන්නේ විවිධ සේවා සමුපකාර සමිතියක භෞතික හා මානව සම්පත් උපයෝජනය එම සමිතියේ කාර්යක්ෂමතාවයට බලපාන්නේ කෙසේද යන්නයි. සීමාසහිත නාඋල විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරෙන් අධ්‍යනය සිදුකර ඇත. පර්යේෂණයේ අරමුණ ලෙස, විවිධ සේවා සමුපකාර සමිතිවල භෞතික හා මානව සම්පත් හඳුනා ගැනීම, විවිධ සේවා සමුපකාර සමිතිවල භෞතික හා මානව සම්පත් උපයෝජනය කරන ආකාරය හඳුනා ගැනීම හා විවිධ සේවා සමුපකාර සමිති වල නිසි සම්පත් උපයෝජනය තුළින් එහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සමිති සූදානම් කළ යුතු ආකාරය හඳුනා ගැනීම දැක්විය හැක. පර්යේෂණයේ සන්දර්භීය වැදගත්කම ලෙස අපේක්ෂා කරන්නේ විවිධ සේවා සමුපකාර සමිති සතු භෞතික හා මානව සම්පත් හඳුනාගැනීමත් එම සමිති දැනටමත් තමන් සතු භෞතික හා මානව සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කරන්නේ ද යන්න හඳුනාගැනීමත්, සමිති වල සම්පත් උපයෝජනය කරන ආකාරය එම සමිති වල කාර්යක්ෂමතාවය කෙරෙහි බලපෑමක් ඇති කර තිබේ ද යන්නත් පරීක්ෂාකර පවත්නා තත්ත්වය හා පැවතිය යුතු තත්ත්වය අතර වෙනස සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමත් වේ. තවද, මෙම අධ්‍යයනයේ හඳුනාගත් සීමාවන් පර්යේෂක විසින් පහත පරිදි දක්වා ඇත. අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ පවතින විවිධ සේවා සමුපකාර සමිති 306 න් එක් විවිධ සේවා සමුපකාර සමිතියක් පමණකි. ඒ අනුව මෙම පර්යේෂණය ශුද්ධ අධ්‍යයනයකි. ශ්‍රී ලංකාව පුරා විසිරී ඇති සමස්ථ විවිධ සේවා සමුපකාර සමිති සඳහා මෙම පර්යේෂණයේ නිගමන නිර්දේශ වෙනස් අයුරින් බලපෑ හැකි වීම මෙහි එක් ප්‍රධාන සීමාවක් ය. පුළුල් සාමාන්‍යකරණයක් සඳහා ගමන් කිරීමට නම් වඩා පුළුල් නියදියක් සමස්ත විවිධ සේවා සමුපකාර සමිති නියෝජනය වන පරිදි තෝරාගත යුතුව ඇත. නමුත්, එවැනි කාර්යයක් කිරීම සඳහා විශාල පිරිස් බලයක් අවශ්‍ය වේ. එමෙන්ම මූල්‍ය ශක්තියක් ද පැවතිය යුතුයි. එවැනි මට්ටමකට මෙම පර්යේෂණ කිරීමේ හැකියාවක් නැත. අධ්‍යයනය සඳහා ලැබී ඇති කාල සීමාව සීමා සහිත බැවින්, දත්ත රැස්කිරීම සීමා සහිත වීම නිසා විස්තරාත්මක විමර්ශනයක් සඳහා අවස්ථාවක් නොමැති වීමද මෙම පර්යේෂණයේ තවත් සීමාවකි .

2. සාහිත්‍ය විමර්ශනය

සමුපකාර ව්‍යාපාරය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රධාන වශයෙන් අංශ තුනක් යටතේ හඳුනාගත හැකිය. එනම්, රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා සමුපකාර අංශය වශයෙන්ය. සමුපකාර අංශය සැලකිල්ලට ගැනීමේදි ජාත්‍යන්තර සමුපකාර සංධානය 1995 පැවති මැන්චෙස්ටර් සමුළුවේදී සම්මත කරගත් අර්ථ දැක්වීම අනුව සමුපකාරය යනු ස්වේච්ඡාවෙන් ඒකාබද්ධ වූ පුද්ගලයින්ගේ

ස්වයංපාලිත සංගමයක් ඔස්සේ ඔවුන්ගේ පොදු ආර්ථික සමාජීය සහ සංස්කෘතික අවශ්‍යතා සහ අභිලාශයන් ඉටු කරන සාමූහික අයිතිය හා ප්‍රජාතාන්ත්‍රික පාලනය ඇති ව්‍යවසායකත්වයකි. (බුලත්ගම, 2014). තවදුරටත්, පහත සාරධර්ම මත සමුපකාරය ව්‍යාපාරය පදනම් වේ. එනම්, ස්වයං වගකීම, ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාවය, සාධාරණත්වය හා සාමූහිකත්වයයි. " එකා සැමටත් සැම එකාටත් " යන ආදර්ශ පාඨය යටතේ ක්‍රියාත්මක වන සමුපකාර ව්‍යාපාරය පහත අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වේ. සාමාජික අවශ්‍යතා සපුරාලීම, මිනිසාට හොඳින් ජීවත්වීමට මාර්ගයක් ඇති කිරීම, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමට සහාය වීම සහ තනි තනිව ඉටුකරගත නොහැකි අවශ්‍යතා සාමූහිකව ඉටුකර ගැනීම ඒ අතුරින් ප්‍රමුඛ වේ. (ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය, 2020). සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති ජනතාවගේ විවිධ වූ අවශ්‍යතා ඉටුකර ගැනිමේ අරමුණෙන් සමුපකාර පරමාර්ථ ඔස්සේ ක්‍රියාත්මක වන සමිති විවිධ සේවා සමුපකාර සමිති ලෙස දැක්විය හැකිය.

විවිධ සේවා සමුපකාර සමිති ඉතිහාසය

මානව ඉතිහාසයේ ආරම්භයේ පටන් සමුපකාර ගති ලක්ෂණ සමාජය තුළ පැවති ඇත. බ්‍රිතාන්‍ය හා ජර්මනිය ප්‍රමුඛ යුරෝපීය රටවල සමුපකාර ව්‍යාපාරය ජනතා නායකයින් විසින් පුරෝගාමීත්වය දෙන ලද ස්වේච්ඡා ව්‍යාපාරයක් ලෙස බිහි වී ඇත. බ්‍රිතාන්‍යයේ Rochdale පුරෝගාමීන් විසින්ද ජර්මනියේ Raiffesen සහ Hass ප්‍රමුඛයින්ද අයර්ලන්තයේ Plunkett සහ Finlay වැනි පරමාදර්ශී නායකයන් විසින්ද සමුපකාර ක්‍රමය ආරම්භ කරන ලදී. (බුලත්ගම, 2014). බ්‍රිතාන්‍ය තම යටත් විජිත වල සමාජ ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා සුදුසු උපාය මාර්ගයක් ලෙස සමුපකාර ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ විසිවන සියවසයේ මුල් භාගයේ දී බ්‍රිතාන්‍ය පාලකයන් විසින් පුරෝගාමීත්වය දෙන ලද ව්‍යාපාරයක් ලෙස සමුපකාර ක්‍රමයක් ආරම්භ වී ඇත. ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය සංවර්ධනය කෙරෙහි බලපෑ සමාජ, ආර්ථික හා දේශපාලනික සාධක ක්‍රියාත්මක වූ ආකාරය සලකා බැලූ විට සමුපකාර ව්‍යාපාරය සංවර්ධනය අවස්ථා තුනක් යටතේ පැහැදිලිව හඳුනාගත හැකිය.1.පුරෝගාමී අවධිය (Pioneer stage) - (1911-1940 දක්වා), 2.ප්‍රගමණ අවධිය (Progressive stage)- (1940-1970 දක්වා), 3.ස්ථාපිත අවදිය (Established stage) - (1970 ට පසු කාලය). (බුලත්ගම, 2014). ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයේ පුරෝගාමී අවධිය ලෙස 1911 සිට 1940 දක්වා වූ කාලය හඳුනාගත හැකිය. මෙම කාලය තුළ බ්‍රිතාන්‍ය යටත් විජිත නිලධාරීන් හා ඔවුන් සමඟ සුහදව සිටි දේශීය රදළ පන්තියේ මූලිකත්වයෙන් සමුපකාර සමිති ආරම්භකර ඇත. තවද, ප්‍රගමණ අවධිය ලෙස 1940 සිට 1970 දක්වා දශක තුනක කාලය හඳුනා ගත හැකිය. මෙම කාලයේ දී සමුපකාර ව්‍යාපාරය ප්‍රවර්ධනයට හා ව්‍යාප්තියට හිතකර සමාජ ආර්ථික පරිසරයක් ඇති වී ඇත. දෙවන ලෝක සංග්‍රාමයේ දී ඇතිවූ ආර්ථිකමය බලපෑම සමුපකාර ව්‍යාපාරය විශාල පරිවර්තනයක් ඇති කිරීමට හේතුවිය. සමිති ක්‍රමය විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ සංවර්ධනය වීමත් එය පුළුල් ලෙස ව්‍යාප්ත වීමත් සිදුවිය. දෙවන ලෝක යුද සමය තුළ ආරම්භ වූ ආහාර සලාක ක්‍රමය නිසා ඇතිවූ පාරිභෝගික සමුපකාර සමිති ක්‍රමය මේ අතර විශේෂ වෙයි. පාරිභෝගික ක්ෂේත්‍රයෙන් බැහැරවූ වෙනත් ක්ෂේත්‍රයන් වෙත යොමුවුණු සාර්ථක සමුපකාර සමිති ගණනාවක් ද ඇති වී ඇත. මේ අතර සඳලංකාව පොල් නිෂ්පාදන සමුපකාර සමිතිය, උඩපළාත කෘෂි නිෂ්පාදන සහ අළෙවි සමිතිය, මින්නේරිය කෘෂි නිෂ්පාදන සමිතිය, යාපනය මලයාලම් දුම්කොළ අලෙවි සමිතිය සහ තෝල්පුරම් මුලායි

සමුපකාර රෝහල් සමිතිය ආදිය විශේෂයෙන් සඳහන් කළ හැකිය. මෙම අවධිය තුළ සමුපකාර ක්ෂේත්‍රයෙහි සිදුවූ විවිධාංගීකරණය එහි ප්‍රවර්ධනය කෙරෙහි බලපා තිබේ. සමුපකාර ණය ගනුදෙනු සහ සකසුරුවම් සමිති ක්‍රමය, කෘෂි නිෂ්පාදන හා අලෙවි පොල්, තේ, රබර් නිෂ්පාදන, දුම්කොළ නිෂ්පාදන, ධීවර නිෂ්පාදන, කිරි නිෂ්පාදන කර්මාන්ත සහ නිවාස සමුපකාර සමිති මේ අතර ප්‍රධාන විය. සමුපකාර මූල්‍ය ක්ෂේත්‍රය තුළ සිදුවූ සංවර්ධනයද වැදගත්ය. 1947 අංක 39 දරණ පනත යටතේ ආරම්භ කළ සමුපකාර ෆෙඩරල් බැංකු (Co-Operative Federal Bank) සහ ඊට සමගාමීව ඇතිවූ සමුපකාර පළාත් බැංකු හා දිස්ත්‍රික් බැංකු ක්‍රමය ද 1964 න් පසු ව්‍යාප්ත වූ ග්‍රාමීය බැංකු පද්ධතියද මේ අතර වැදගත් වේ. තවදුරටත් සඳහන් කිරීමේදී අබේසිංහ (2011), අනුව 1957 වර්ෂයේදී සමුපකාර සමිති ක්‍රමය තුළ ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීමට රජයට අවශ්‍ය විය. ඒ අනුව, ජනතා නායකත්වය තුළ ස්වාධීන ප්‍රජාතාන්ත්‍රීය පාලනයක් සහිතව ක්‍රියාත්මක වූ විවිධ සමුපකාර සමිති ක්ෂේත්‍රයන් එක් සමිති පද්ධතියක් ලෙස ඒකාබද්ධ කර විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමය ඇති කරන ලදී. අනෙක් අතට, සමුපකාර ගමන් මගෙහි ස්ථාපිත අවධිය ලෙස 1970 ට පසු අවධිය හඳුනාගත හැකිය. මෙම ස්ථාපිත අවධිය තුළ සමුපකාර සමිති ඉහළ ව්‍යවසාය මට්ටමක් ළඟා කර ගැනීමට අවශ්‍ය වන සමාජ ආර්ථික සාධක එහි ගමන් මඟට හිතකර වන ලෙස පාලනය කරගත හැකි අවධියයි. ස්ථාපිත අවධිය තුළ සමුපකාර සංවිධාන විසින් අතිරික්තයක් නැතහොත් ලාභයක් ලබා ගන්නා ආයෝජන පදනම් කරගෙන මූල්‍ය නිෂ්පාදන හා මානව සම්පත් කළමනාකරණය කළ යුතුය. ව්‍යවසායන්හි මෙන්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුවක් මත සැලසුම් කරන ලද ව්‍යාපාරික සංවර්ධනයක යෙදිය යුතුයි. එමෙන්ම, පුහුණුව හා පර්යේෂණ තුළින් ලබාගන්නා දැනුම සහ පරිචයද, තාක්ෂණය ද භාවිතා කළ යුතුයි. මෙම අවධිය තුළදී සමුපකාර සංවිධාන ස්වශක්තිය මත ගොඩනැගී සිටිය යුතුය. නමුත් 1977 වර්ෂය පමණ වන විට ඇතිවූ විවෘත ආර්ථිකයේ ප්‍රතිවිපාක සමුපකාර ව්‍යාපාරයට බෙහෙවින් බලපා ඇත. පුද්ගලික අංශයේ ව්‍යාපාර වල කළමනාකරණ සංවර්ධනයට සමගාමීව සංවර්ධනය වීමට සමුපකාර කළමනාකරණයට ශක්තියක් නොමැති විය. ගෝලීයකරණ ප්‍රවණතාවයන්ට අනුගත වීමට හැකි නායකත්වයක් සංවර්ධනයක් හෝ කළමනාකාරීත්ව සංවර්ධනයක් සමුපකාර ක්ෂේත්‍රය තුළ ඇති නොවීම මෙම තත්ත්වය කෙරෙහි බලපා තිබේ.

ආර්ථික විද්‍යා දෘෂ්ටියෙන් සමුපකාර සමිතියක ඇති සම්පත්

නිෂ්පාදන සම්පත් ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් වශයෙන් ප්‍රධාන වශයෙන් වර්ග කළ හැකිය. ආර්ථික සම්පත් සඳහා මිලක් පවතී විකල්ප ප්‍රයෝජන ඇත. එම නිසා ආවස්ථික පිරිවැයක් ඇත. මෙම සම්පත් අසීමිත වුවමනාවන්ට සාපේක්ෂව සැපයුම සීමාසහිත වේ. ආර්ථික සම්පත් වල මූලික ලක්ෂණය හිඟකමයි. ආර්ථික නොවන සම්පත් වල ප්‍රධාන ලක්ෂණය වන්නේ විකල්ප ප්‍රයෝජන නැත, තේරීම්ක් නැත, හිඟකම නැත, ආවස්ථික පිරිවැයක් නැත. නිෂ්පාදන සම්පත් ප්‍රධාන වශයෙන්, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, ශ්‍රමය, භූමිය ලෙස කොටස් හතරකට වෙන් කළ හැකිය. භාණ්ඩ නිෂ්පාදනයේ දී හා සේවා සැපයීමේදී යොදා ගන්නා සම්පත් නිෂ්පාදන සම්පත් වේ. ආර්ථික සම්පත් මෙන්ම ආර්ථික නොවන සම්පත් වලින් ද නිෂ්පාදන සම්පත් සමන්විත වේ. (හිදැල්ලආරච්චි, 2007).

භූමිය

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා දායකකර ගත හැකි ස්වභාවධර්මයෙන් මිනිසාට ලැබී ඇති නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි සියලුම ස්වභාවික සම්පත් භූමිය ලෙස හඳුනාගත හැකිය. (හිදැල්ලආරච්චි, 2007). මෙම ස්වභාවික සම්පත්වල සැපයුම වෙනස් කළ නොහැකි වේ. නමුත් ආර්ථික වශයෙන් යොදා ගන්නා විට භූමියේ සැපයුම වැඩි කරගත හැකි වේ. සමහර භූමි සම්පත් නැවත ගොඩනැංවිය හැකි සම්පත් වේ. උදාහරණ මිරිදිය මසුන්, ජලය, වනාන්තර වේ. ඇතැම් භූමි සම්පත් භාවිතයත් සමග ක්ෂය වීයයි. ඛනිජ තෙල්, ගල් අඟුරු, යපස්, රත්රන් මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකිය. භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා සේවා සැපයීම සඳහා යොදා ගන්නා සියලුම යෙදවුම් නිෂ්පාදන සම්පත් වශයෙන් හඳුනාගත හැකිය. මෙම නිෂ්පාදන සම්පත් උපරිම දායකත්වයක් ලැබෙන ලෙස භාවිතා කිරීමෙන් රටක තිරසාර සංවර්ධනයක් ඇතිකර ගත හැකිවේ. සම්පත් නිසි පරිදි කළමනාකරණය කිරීම යනු කාර්යක්ෂමතාවය හා ඵලදායීව සම්පත් භාවිතා කිරීමයි. (කළුආරච්චි, 2012). වර්තමානයේ ශ්‍රී ලංකාවේ විවිධ සේවා සමුපකාර සමිති 306 ක් පමණ ක්‍රියාත්මක වෙයි. මෙම විවිධ සේවා සමිති සතුව ප්‍රාදේශික වෙළඳසැල්, තොග ගබඩා, කෝප්සිටි, මිනි කෝප්සිටි, ඉන්ධනහල්, අවමංගල්‍ය සේවා, ග්‍රාමීය බැංකු ශාඛා හා වාහන වැනි විශාල සම්පත් ප්‍රමාණයක් පවතී. සමුපකාර ක්ෂේත්‍රයෙන් ජාතික නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් ද දක්වයි. වර්තමානයේ පවතින කොවිඩ් - 19 අර්බුදකාරී අවස්ථාවල ජන ජීවිතය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහාත් වෙළඳපලේ භාණ්ඩවල මිල පාලනයක් පවත්වා ගැනීමටත් අවශ්‍ය අවස්ථාවල වී මිල දී ගැනීම, සහල් සීනි වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පාලන මිලට ජනතාවට ලබා දීම වැනි කටයුතු සඳහා සමුපකාර සමිති මගින් ලැබෙන පිටුවහල ඉතා විශාල වේ. (සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, 2017). විවිධ සේවා සමුපකාර සමිති තමන් සතු සම්පත් නිසි පරිදි උපයෝජනය කිරිම සමිතියේ සාර්ථකත්වයට සෘජුවම බලපානු ලබයි. අමුද්‍රව්‍ය ඵලදායීතාව ද විවිධ සේවා සමුපකාර සමිති වල සම්පත් උපයෝජනයට සෘජුවම බලපාන සාධකයකි. යම්කිසි ද්‍රව්‍ය ප්‍රමාණයක් යොදා ගනිමින් ගුණාත්මක තත්වයෙන් යුතුව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ ප්‍රමාණය මැන බැලීමෙන් ඵලදායිතාව ගණනය කළ හැකිය. නිෂ්පාදනයේදී අමුද්‍රව්‍ය නාස්ති වීම අවම කිරිම තුලින් උපරිම අමුද්‍රව්‍ය ඵලදායිතාවක් ලබා ගත හැකිවේ. එමෙන්ම නිෂ්පාදනය කරන භාණ්ඩයේ දෝෂ අවම කිරීම තුළින් නැවත නිෂ්පාදනය කිරීමට අවශ්‍ය නොවීම මත ද අමුද්‍රව්‍ය ඵලදායිතාව වැඩිකර ගත හැකිය. (රාජරත්න, 2014). එමෙන්ම, බලශක්ති ඵලදායිතාවද සම්පත් නිසි පරිදි උපයෝජනයට සෘජුවම බලපානු ලබයි. යම් ආයතනයක් තුළ අවම බලශක්තිය භාවිතා කර වැඩි භාණ්ඩ ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම බලශක්ති ඵලදායිතාවය නම් වේ. උදාහරණ ලෙස ආයතනයක් තුළ ආලෝකය ලබා ගැනීම සඳහා භාවිතා කරන සාමාන්‍ය සූත්‍රිකා බල්බ දැල්වීම තුළින් දිනකට වැය කරන ඒකක ප්‍රමාණය LED බල්බ භාවිතා කිරීමකින් අඩුකර ගත හැකි වේ. එය බලශක්ති ඵලදායිතාවය වැඩි වීමක් ලෙස දැක්විය හැකිය.

ප්‍රාග්ධනය

ප්‍රාග්ධනය යන්න සාමාන්‍ය ව්‍යවහාරය තුළ භාවිතා වන්නේ ව්‍යාපාරයක් සඳහා යොදවන මූලික ධනය ලෙසයි. (අතපත්තු, 2008). නමුත්, මිනිසා විසින් නිෂ්පාදනය කරන ලද

නිෂ්පාදන ආධාරක හා සේවා සැපයුම් ආධාරක ප්‍රාග්ධනය ලෙස හඳුනාගත හැකිවේ. මේවා නිෂ්පාදනයේ දී ක්ෂය වීමකට ලක්වන වත්කම්ය. උපකරණ, කම්හල්, ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍ර මේ සඳහා වූ උදාහරණ වේ. එක් එක් ආයතනයක පවතින තාක්ෂණික මට්ටම හා එක් එක් ආයතනයක පවත්නා විද්‍යාත්මක හා තාක්ෂණික දැනුමේ ප්‍රමාණත් ඒ දැනුම සංවර්ධනය කිරිම සඳහා වැය කරන සම්පත් ප්‍රමාණය මත එම ආයතනයේ ප්‍රාග්ධනය තීරණය වේ. ප්‍රාග්ධන ඵලදායිතාව ගැන සලකා බැලිම සම්පත් උපයෝජනයට වැදගත් වේ. ඕනෑම ක්‍රියාවක් අවසානයේ එහි ප්‍රතිඵල මූල්‍යමය අගයක් මත රඳා පවතින හෙයින් ඉහත සඳහන් ඵලදායිතා අංශ සියල්ල අවසන් වශයෙන් ප්‍රාග්ධන ඵලදායිතාව යටතේ සලකා බලයි. එනම්, යොදන මුදල් ඒකකයකට ආපසු ලැබෙන ලාභ ප්‍රමාණය හෝ කරන වැඩ ප්‍රමාණය හෝ ගණනය කිරීම ප්‍රාග්ධන ඵලදායිතාව යටතේ සිදු කෙරේ. (රාජරත්න, 2014). ශ්‍රී ලංකාවේ විවිධ සේවා සමුපකාර සමිති සතුව විශාල භෞතික හා මානව සම්පත් ප්‍රමාණයක් පවතී. මෙම සම්පත් ආයතනයේ නිෂ්පාදන කටයුතු හා සේවා සැපයීම සඳහා කාර්යක්ෂම ලෙසත් ඵලදායී ලෙසත් යොදා ගැනීම සිදු කර නැත. බාහිර පාර්ශවයන් සඳහා කුලී පදනම මත සම්පත් ලබා දී ඇත. ලැබෙන මුදලින් සේවකයින් සඳහා වැටුප් හා වේතන ලබා ගැනීමේ කාර්යයේ නිරත වී ඇති ස්වභාවයක් බොහෝවිට විවිධ සේවා සමුපකාර සමිති වල දැකිය හැකිය.

ශ්‍රමය

යම් කාල පරිච්ඡේදයක් තුළ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා සේවා සැපයීම සඳහා නියුක්ත වූ ශ්‍රම පැය ගණන ශ්‍රම සැපයුම වේ. රටක ශ්‍රම බලකාය හා වැටුප් මට්ටම අනුව ශ්‍රම සැපයුම තීරණය වේ. (අතපත්තු, 2008). කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනයේ දී හෝ කිසියම් සේවයක් සැපයීමේ දී එහි එක් එක් කොටස් විවිධ ශ්‍රමිකයන් අතින් සිදු කිරීමේ ක්‍රියාවලිය තුළින් අදාල කාර්යය සඳහා විශේෂ ප්‍රාගුණ්‍යයක් ඇති කරගත හැකිය. මෙය ශ්‍රමවිභජනය ලෙස හඳුනාගත හැකිය. යම් ආයතනයක නිෂ්පාදන පිරිවැය හෝ සේවා සැපයීමේ පිරිවැය අඩුකර ගැනීම සඳහා තරඟකාරීත්වය ඉහල නැංවීම සඳහා ශ්‍රම විභජනය භාවිතා කළ හැකිවේ. (කළුආරච්චි, 2012). ශ්‍රමිකයා සතු දැනුම, පළපුරුද්ද සහ කුසලතාවය මත යම් ආයතනයක මානව ප්‍රාග්ධනය තීරණය වේ. තවද, ආයතනයක භෞතික සම්පත් මෙන්ම මානව සම්පත් ද එම ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවයට බලපාන ප්‍රධාන සාධකයක් වේ. ආයතනයක සම්පත් අතුරින් වටිනාම සම්පත මානව සම්පතයි. එමෙන්ම, පාලනය කිරීමට අපහසුම සම්පතද මානව සම්පතයි. ආයතනයක් සතුව පවතින මිනිසුන් හා ඔවුන් සතුව ඇති ශක්තීන්, දැනුම, කුසලතා හා අත්දැකීම් නිෂ්පාදන කටයුතුවලට යොමු කර ගැනීම තුළින් එම ආයතනයේ සාර්ථකත්වය ඇති කරගත හැකි වේ. තවද, අතපත්තු (2008), අනුව අනෙකුත් සම්පත් වලට සාපේක්ෂව මානව සම්පතෙහි විශේෂ ලක්ෂණ කිහිපයක් දැකිය හැකිය. එය සජීවී ප්‍රාණික වීම, සිතීමට ප්‍රතික්‍රියා දැක්වීමට හැකියාවක් තිබීම, මානව සම්පතෙහි පිරිවැය වන වේතන තීරණය කිරීමට බලපෑම් කිරීමට හැකියාවක් තිබීම, කාලය ගතවීමත් සමඟ පුහුණුව, අත්දැකීම්, අධ්‍යාපනය ආදී කරුණු මඟින් මානව සම්පතෙහි අගය වැඩිවීම, වෘත්තීය සමිති කණ්ඩායම් ආදී වශයෙන් සංවිධානය වීමේ හැකියාව පැවතීම, නිර්මාණශීලී වීම, ඔහුට/ ඇයට ආවේණික වූ ස්වීයත්වයක් තිබීම හා අනෙකුත් සියලු සම්පත් පිළිබඳ තීරණ ගනු ලබන්නේ මානව සම්පත් මගින් වීම ලෙස දැක්විය හැක. එබැවින්, ආයතන තම ආයතනයේ සඵලදායකත්වය පිණිස උපරිම පුද්ගල දායකත්වයක් ලබාගත හැකි ඉතාමත් යෝග්‍ය හා තෘප්තිමත් මානව බලයක් පවත්වා ගත යුතුව ඇත. එසේම, යම් ආයතනයක මානව සම්පත එම ආයතනයේ පැවැත්මට සිය බුද්ධිය, ආකල්ප කුසලතා සහ පළපුරුද්ද විධිමත් ලෙස

භාවිතා කරන්නේ නම් එය එම ආයතනයේ භෞතික සම්පත් මනා ලෙස කළමනාකරණය කිරීමට මහත් සේ උපකාරී වනු ඇත. එබැවින් ආයතනයක මානව සම්පත කළමනාකරණය කිරීම තුළින් ආයතනයේ ඵලදායිතාව වැඩිකර ගත හැකිය. (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය, 2015). යම් ආයතනයක මානව සම්පත්, යන්ත්‍රෝපකරණ, අමුද්‍රව්‍ය ක්‍රමවේද හා තොරතුරු ඒකරාශී කර ක්‍රියාවලියට ලක් කිරීම් තුළින් පරිසරයට හෝ කිසිම ජීවියෙකුට හානියක් නොකර එම යෙදවුම් වලින් උපරිම හා ගුණාත්මක ප්‍රතිඵලයක් එම ආයතනය ලබා ගනීද එම ආයතනය ඵලදායිතාවේ උපරිම තත්වයට පත්වී ඇතැයි කියනු ලැබේ. (රාජරත්න, 2014). ශ්‍රම ඵලදායීතාව ප්‍රශස්තව පවත්වා ගැනිම පූර්ණ සම්පත් උපයෝජනයකට හේතු විය හැක. ආයතනයක සේවකයින් සියල්ල එකට එක්ව පැයක දී කරන කාර්යය එම වැඩ පරිසරය ක්‍රමානුකූලව විධිමත්ව සකස් කිරීම තුළින් පැය භාගයකින් කිරීමට හැකි වේ නම්, එම ආයතනයේ ශ්‍රමය ඵලදායි ලෙස යොදා ගත් බවට සතුටු විය හැකිය. තවද, ආයතනික ක්‍රියාවලිය අධ්‍යනය කර අනවශ්‍ය ක්‍රියා වලින් ඉවත් කිරීම හා අවශ්‍ය ක්‍රියාවලි සරල කිරීම තුළින් එක් කාර්යයක් සඳහා යොදන සේවක සංඛ්‍යාව අවම කිරීමට හැකියාව ලැබේ. තවද, හිඳැල්ලආරච්චි (2007), අනුව ශ්‍රමය ඉතිරි කිරීම හා ශ්‍රමිකයන් අවම ප්‍රමාණයකින් කාර්යය ඉටුකර ගැනීම මඟින් ශ්‍රම ඵලදායිතාවය වැඩි කළ හැකිය. සේවකයින්ගේ වැඩ පරිසරය සකස් කිරීම, ශරීරය හසුරුවන රටාව සකස් කිරීම හා ඉලක්ක ඉක්මවා නිපදවන සෑම ඒකකයකටම යම් ගෙවීමක් සිදු කිරීම මගින් සේවකයින්ගේ උපරිම ශක්තිය ආයතනයේ කාර්යය ඉටුකර ගැනීම සඳහා යෙදවිය හැකිය.

ව්‍යවසායකත්වය

ව්‍යවසායකත්වය යන්නට ගෝලීය නිර්වචනයක් නොමැති නමුත් විවිධ ආයතන හා ආර්ථික විද්‍යාඥයින් විසින් විවිධ පදනම් මත ව්‍යවසායකත්වය නිර්වචනය කර ඇත. (වීරසුන්දර, 1996). යුරෝපානු සංගමය 2016 අදහස් ක්‍රියාවට නැංවීම ව්‍යවසායකත්වය ලෙස නිර්වචනය කර ඇත. තවද භූමිය, ශ්‍රමය හා ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක සංකලණය කරමින් තම ව්‍යාපාර කටයුතු සිදුකිරීම ව්‍යවසායකත්වය වේ. ව්‍යවසායකත්වය ශ්‍රමයෙන් වෙන් කොට දැක්විය හැකි සුවිශේෂී මානව සම්පත් විශේෂයක් ලෙස හඳුනාගත හැකිය. නිෂ්පාදන ක්‍රියාවලියක සමස්ත කාර්යක්ෂමතාවය නැංවීමට හැකි වන ආකාරයට සම්පත් උපයෝජනය කිරීම (භාවිත කිරීම) සහ මෙහෙයවීම කළමනාකරණය ලෙස හැඳින්වෙයි. (රාජරත්න, 2014). ඒ අනුව, ව්‍යවසායකත්වය හා කළමණාකරනය යනු එකිනෙක සමාන අර්ථයෙන් භාවිතා නොවන්නකි. සරලව ප්‍රකාශ කළහොත් සමස්ත නිෂ්පාදනයේ හිමිකරුවන් ව්‍යවසායකයන් ලෙස සැලකෙන අතර ඔවුන් වෙනුවෙන් නිෂ්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම කළමනාකරුවන් විසින් සිදු කරනු ලැබේ.

3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී පර්යේෂකයා විසින් ප්‍රේරක ප්‍රවේශය යටතේ ගුණාත්මක දත්ත ද සංඛ්‍යානමය දත්ත ද විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත. සීමාසහිත නාඋල විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා විධායක නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, සීමාසහිත නාඋල විවිධ සේවා සමුපකාර සමිතිය සහභාගිත්ව නිරීක්ෂණයට ලක් කිරීම,අධ්‍යනයට ලක් කළ සීමාසහිත නාඋල විවිධ සේවා සමුපකාර සමිතිය මූල්‍ය ප්‍රකාශන

හා අනෙකුත් විවිධ ලිඛිත මූලාශ්‍ර පරිහරණය, සීමාසහිත නාඋල විවිධ සේවා සමුපකාර සමිතියේ මහා සභා වාර්තා මඟින් තොරතුරු ලබා ගැනීම හා ප්‍රදේශයේ සිටින සමාන ව්‍යාපාර කටයුතු වල යෙදෙන පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් පර්යේෂණයට අවශ්‍ය දත්ත රැස්කර ගන්නා ලදි. සංඛ්‍යානමය දත්ත වගු, ප්‍රස්ථාර මගින් විශ්ලේෂණය කර ඇත.

4. දත්ත විශ්ලේෂණය හා ප්‍රතිඵල

මෙම පර්යේෂණයේදී අවධානයට යොමු කර ඇත්තේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය බලප්‍රදේශය කරගත් සීමාසහිත නාඋල විවිධ සේවා සමුපකාර සමිතිය කෙරෙහිය. නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති මෙම සමිතිය 1960 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර ලියාපදිංචි අංක මාලේ 277 යටතේ 1971.02.05 දින සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත. සමිතියේ වර්තමාන සාමාජික සංඛ්‍යාව 10,900 පමණ වේ. සාමාජික කොටසක වටිනාකම රුපියල් 100.00 කි. සමිතියේ කොටස් ප්‍රාග්ධනය 2021.06.30 දිනට රු.1,613,775.00 කි. ජාත්‍යන්තර සමුපකාර ප්‍රතිපත්ති අනුව ප්‍රජාතාන්ත්‍රවාදී සාමාජික පාලනයක් මෙම සමිතිය තුළ දැකිය හැකිය. වර්තමානයේ සමිතියේ මහා සභාව නියෝජිතයින් 81 කින් සමන්විත අතර ඒ අතරින් තෝරාගත් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් නවදෙනකු මඟින් සමිතියේ පාලන කටයුතු සිදුකරනු ලබයි. නමුත් මෙහි පාලකයන් තුල හොඳ ව්‍යවසායක ගතිලක්ෂණ නිරීක්ෂණය නොවේ. ප්‍රදේශයට ගැලපෙන නව ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීමක් නිරීක්ෂණය නොවේ. දැනට පවතින සාම්ප්‍රදායික ව්‍යාපාරික කටයුතු ද නිසි සැලසුමක් හා මනා කළමණාකාරීත්වයක් මත පවත්වාගෙන යනබව දැකිය නොහැකිය. සමිතියේ දැනට පවත්වාගෙන යන ව්‍යාපාරික අංශ පහත පරිදි වේ. පාරිභෝගික අංශය - මිනි කෝප්සිටි 01 ද, ග්‍රාමීය බැංකු අංශය බැංකු ශාඛා 22 කින් ද ඉන්ධන අංශය ඉන්ධන හල් එකකින් ද, සන්නිවේදන අංශය වෙළඳසැල් එකකින් ද සමන්විත වේ. "ව්‍යාපාරයක් ආරම්භ කිරීමෙන් පසු ඒ සඳහා සියලු ධෛර්ය යොදා කැප නොවන්නේ නම් ව්‍යාපාර කාර්ය සාර්ථක කරගත නොහැක" (රාජරත්න, 2014). සමිතියේ මාසික මෙහෙයුම් වාර්තා (F28) මඟින් ලබාගත් තොරතුරු පහත වගුව හා ප්‍රස්ථාර මගින් දක්වා ඇත.

වගුව 01: 2021 ජනවාරි සිට ජූනි දක්වා, ව්‍යාපාර අංශවල ලාභ/ අලාභ තත්වය (රු.)

අංශය/ මාසය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි
පාරිභෝගික	(76,107)	(164,794)	(88,265)	(170,338)	1,682,901	243,302
ග්‍රාමීය බැංකු	(927,692)	(2,908,861)	(2,087,512)	(4,387,228)	(4,853,193)	4,037,760)
ඉන්ධන	(186,260)	(238,644)	(343,641)	(280,384)	141,637	(17,941)
සන්නිවේදන	(78,691)	(9,044)	(7,994)	(45,715)	(11,879)	(25,937)
එකතුව	(1,111,368)	(3,303,255)	(1,840,130)	(4,883,665)	(3,040,534)	(3,838,336)

මූලාශ්‍රය - 2021 මාසික මෙහෙයුම් වාර්තා (F28)

සමිතියේ ප්‍රධාන ව්‍යාපාරික අංශයක් වන පාරිභෝගික අංශය මහනුවර යාපනය A-9 මාර්ගයට මුහුණලා නාඋල නගරයේ පිහිටා ඇත. මෙම කෝප්සිටි වෙළඳසැල ද පාඩු ලබන තත්ත්වයක පවතී. 2021 වර්ෂයේ මැයි හා ජූනි මාසවල නාඋල නගරයට සංචරන සීමා පැනවීම මත රජයෙන් අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබාදුන් භාණ්ඩ මළු 6,200 සමුපකාර සමිතිය මගින්

ලබාදීම මත එම මාස දෙකෙහි පමණක් කෝප්සිටි අංශය ලාභ ලබා ඇත. ඉතිරි මාස හතර අලාභ ලබා ඇත. පහත ප්‍රස්තාරය මඟින් පාරිභෝගික අංශයේ ශුද්ධ ලාභ/අලාභ තත්වය පැහැදිලි වේ.

ප්‍රස්තාරය 01: පාරිභෝගික අංශයේ ශුද්ධ ලාභ/ අලාභ තත්වය



මූලාශ්‍රය - පර්යේෂක විසින් ගොඩනගන ලදී.

ග්‍රාමීය බැංකු ශාඛා 22 මඟින් බලප්‍රදේශය පුරා ව්‍යාපාරික කටයුතුවල නිරත උවද, මනා කළමනාකාරිත්වයක් නොමැතිවීම මත මෙම අංශය දිගින් දිගටම අලාභ ලබන තත්වයක් දැකගත හැකිය. පහත ප්‍රස්තාරය මඟින් පාරිභෝගික අංශයේ ශුද්ධ අලාභ තත්වය පැහැදිලි වේ.

ප්‍රස්තාරය 02: පාරිභෝගික අංශයේ ශුද්ධ අලාභ තත්වය



මූලාශ්‍රය - පර්යේෂක විසින් ගොඩනගන ලදී.

ඉන්ධන අංශයට අයත් ඉන්ධන හල A-9 මාර්ගයට මුහුණලා නාඋල නගර මධ්‍යයේ පිහිටා ඇත. 2021 මාර්තු හා මැයි මාසවල පමනක් ලාභ ලබා ඇත. මනා කළමනාකාරීත්වයක් නොමැතිවීම මත ඉන්ධන හල ඉතිරි මාස හතර පාඩු ලබා ඇත. පහත ප්‍රස්තාරය මඟින් ඉන්ධන හලෙහි ශුද්ධ ලාභ/අලාභ තත්වය පැහැදිලි වේ.

ප්‍රස්තාරය 03: ඉන්ධන හලෙහි ශුද්ධ ලාභ/අලාභ තත්වය



මූලාශ්‍රය - පර්යේෂක විසින් ගොඩනඟන ලදී.

සන්නිවේදන අංශයද මාස දෙකක් ලාභදායී ලෙස පවත්වාගෙන ගොස් ඇති අතර ඉතිරි මාස හතර අලාභ ලබන තත්වයක් දැකගත හැකිය. පහත ප්‍රස්තාරය මඟින් සන්නිවේදන අංශයේ ශුද්ධ ලාභ/අලාභ තත්වය පැහැදිලි වේ.

ප්‍රස්තාරය 04: සන්නිවේදන අංශයේ ශුද්ධ ලාභ/අලාභ තත්වය.

මූලාශ්‍රය - පර්යේෂක විසින් ගොඩනඟන ලදී.

සමිතියේ දැනට පවත්වාගෙන යන ව්‍යාපාරික අංශ සියල්ල අලාභ ලබයි. වසර ගණනාවක සිට ඉදිරියට එන ණයගැති ශේෂ සමිතියේ ශේෂ පත්‍රය තුල පවතී. ග්‍රාමීය බැංකු අංශයේ ණය අයකර ගැනීමද ක්‍රමවත්ව සිදුනොකරයි. 2021.06.30 දිනට කල්පසු ණය ප්‍රතිශතය 43.63% කි. ඉන්ධන අංශයට අයත් ඉන්ධන හල A-9 මාර්ගයට මුහුණලා නාඋල නගර මධ්‍යයේ පිහිටා ඇත. නමුත් මනා කළමනාකාරීත්වයක් නොමැතිවීම මත ඉන්ධන හලද පාඩු ලබයි. ඉන්ධන තොග මිලදී ගැනීමට ප්‍රමාණවත් මුදල් නොමැතිව ග්‍රාමීය බැංකු අංශයේ ඇති සාමාජික හා සාමාජික නොවන තැන්පත් මුදල් ඉන්ධන මිලදී ගැනීම සඳහා යොදාගැනීම සිදුකරයි. පාරිභෝගික අංශයේ වෙළඳසැලද සන්නිවේදන අංශයේ වෙළඳසැලද මනා කළමනාකාරීත්වයක් නොමැතිවීම මත අලාභ ලබන බව නිරීක්ෂණය වේ. නමුත් ඉහත

ව්‍යාපාරික කටයුතුවල නිරත ප්‍රදේශයේ වෙනත් ව්‍යාපාරික ආයතන මෙපමණ තරම් සම්පත් ප්‍රමාණයක් නොමැතිවද තම ව්‍යාපාරික කටයුතු සාර්ථකව පවත්වාගෙන යන ආකාරය නිරීක්ෂණය කරගත හැකිවිය. සමිතිය සතුව පවතින ඉඩම් ගොඩනැගිලි හා උපකරණ ප්‍රමාණය පහත 2 වගුවෙන් දක්වා ඇත.

වගුව 01: ඉඩම් ගොඩනැගිලි හා උපකරණ ප්‍රමාණය

අ/අං	විස්තරය	ප්‍රමාණය
• ඉඩම් හා ගොඩනැගිලි		
01	ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම හා ගොඩනැගිලි	අක්කර 01
02	නාලන්ද මිනි කෝප්සිටි පිහිටි ඉඩම හා ගොඩනැගිලි	පර්චස් 60
03	කරවිලහේන් ඉඩම	පර්චස් 15
04	අරංගල වී ගබඩාව පිහිටි ඉඩම හා ගොඩනැගිලි	අක්කර 02
05	අරංගල වී මෝල	පර්චස් 40
06	පුබ්බිලිය ඉඩම	පර්චස් 20
07	මොරගොල්ල ඉඩම	පර්චස් 15
08	කනමූලයාය ඉඩම	විස්තර නැත
09	වල්මෝරුව ඉඩම	විස්තර නැත
10	හතමුණ ගාල ඉඩම	විස්තර නැත
11	හුන්ගන්වෙල ඉඩම	පර්චස් 20
12	කෝන්ගහවෙල මිනි කෝප්සිටිය පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල	පර්චස් 60
13	පිළිහුඩුගොල්ල ඉඩම හා ගොඩනැගිල්ල	පර්චස් 20
14	පිරවුම්පොල	පර්චස් 60
• උපකරණ		
• රථ වාහන (CP LB - 2839 කැබ් රථය)		

මූලාශ්‍රය - සී/ස නාඋල විවිධ සේවා සමුපකාර සමිතියේ වට්ටෝරු පොත

මෙයින්ද, ප්‍රධාන කාර්යාලය අසල පිහිටා ඇති මිනි කෝප්සිටි වෙළඳසැල පෞද්ගලික අංශයට කුලියට ලබා දී තිබී 2020 වර්ෂයේ රජයේ වැඩසටහනක් යටතේ සෑම විවිධ සේවා සමුපකාර සමිතියකටම කෝප්සිටි වෙළඳසැලක් ආරම්භ කිරීමට සමගාමීව ආරම්භ කර පවත්වාගෙන යයි. වර්තමානයේ ගෝලීය වසංගතයක්ව පවතින covid-19 වසංගත තත්ත්වය මත රජය මඟින් අඩු ආදායම්ලාභී පවුල් හා ආදායම් අහිමි වූ පවුල් සඳහා බඩුමළු බෙදාහැරීමේදී අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය මළු සකස් කිරීමේ කාර්යය සමුපකාර සමිතිය වෙත ලබා දී තිබුනි. එහිදී, අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය තොග ලබා ගැනීම බහුලව සිදු කරන ලද්දේ නාඋල නාලන්ද ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික තොග වෙළෙඳසැලකින් බව සහභාගිත්ව නිරීක්ෂණයේ දී දැකගත හැකි විය. සමිතිය සතු කැබ් රථය ද වසර ගණනාවක් භාවිතා කළ නොහැකි ලෙස පැවත 2020 වර්ෂයේ දී නැවත අළුත්වැඩියා කර ධාවනයට යොදවා ඇත. නගරයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ කොටසක් මහජන බැංකුව සඳහා බද්දට ලබා දී තිබී ඇත. මහජන බැංකුව වෙනත් ස්ථානයකට රැගෙන යාම නිසා එම ගොඩනැගිල්ල ද භාවිතයට නොගෙන දැනට වසර හතරක පමණ කාලයක් පවතී. ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ අනෙකුත් කඩ කාමර සියල්ල පෞද්ගලික ව්‍යාපාරික කටයුතු සඳහා බදු පදනමට ලබා දී ඇත. තවද, අරංගල ප්‍රදේශයේ සමිතිය සතු A-9 මාර්ගයට මුහුණලා පිහිටි අක්කර දෙකක පමණ ඉඩම හා එහි පිහිටා ඇති ගොඩනැගිලි පෞද්ගලික අංශයට බදු දී ඇත. එමෙන්ම, නාලන්ද හා හුංගන්වෙල පිහිටි ඉඩම ද A-9 මාර්ගයට මුහුණලා ජනාකීර්ණ

ප්‍රදේශයන්හි පැවතියද එම ගොඩනැගිලි ද බදු පදනම මත පුද්ගලික ව්‍යාපාර සඳහා ලබා දී ඇත. ඇතැම් ගොඩනැගිලි වල ග්‍රාමීය බැංකු ශාඛා පමණක් පවත්වාගෙන යයි. සමිති බල ප්‍රදේශය තුල ග්‍රාමීය බැංකු ශාඛා 22 ක් සමිතිය මගින් පවත්වාගෙන යන අතර එම ස්ථානවල පිහිටි ගොඩනැඟිලි ද අබලන්ව ඇත. මහජන ආකර්ෂණයක් ලැබෙන සේ ගොඩනැඟිලි ඉදිකිරීම සිදුකර නැත. බැංකු ශාඛා තුල අවම පහසුකම් පවා නොමැති තත්වයක් නිරීක්ෂණය වේ. තවද, ග්‍රාමීය බැංකු ශාඛා තුනක් පමණක් පරිගණකගත කර ඇත. "Accept IT and change your approach, if you want to use technology to help organize your day. There is no halfway house" (කමලදාස, 2010). සමිතියේ සියළුම ග්‍රාමීය බැංකු ශාඛා පරිගණකගත නොකිරීම මත ග්‍රාමීය බැංකු ශාඛා පද්ධතිය ජාලගත කිරීමට නොහැකිවී ඇත. ඒ තුල පරිගණකගත කිරීම මඟින් ලබාගත හැකිව තිබූ කාර්යක්ෂමතාවය සමිතියට ලඟාකර ගැනීමට නොහැකිවී ඇත.

සමිතිය සතුව පවතින මානව සම්පත

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සමිතියට අනුමත කළ පිරිස් බල තක්සේරුව අනුව පිරිස් බලය හැටතුන්දෙනෙකි. සමිතියේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳව අවධානය යොමුකිරීමේදී දැනට සේවය කරන සේවකයන්ගෙන් සේවකයින් තිස්තුන්දෙනෙකු ස්ථිර සේවකයන්වේ. ඉතිරි සේවකයන් තිස්දෙනා පුහුණුවන, තාවකාලික හා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇත. සමිතියේ දැනට විධායක තනතුරු හතරක් සඳහා සේවකයන් සේවයේ යොදවා ඇත. සමිතියේ පාලන ව්‍යුහයේ ඇති අනෙකුත් විධායක තනතුරු පුරප්පාඩු ලෙස පවතී. සමිතියේ ප්‍රධාන විධායක නිලධාරීවරයා සාමාන්‍යාධිකාරීය. ඔහු එම තනතුරෙහි ස්ථිර සේවකයෙකි. දැනට වසරකට ආසන්න කාලයක් සාමාන්‍යාධිකාරීවරයා බැංකු සේවා කළමනාකරු තනතුරේ ද වැඩබැලීම සිදුකරයි. සමුපකාර සේවකයන් සම්බන්ධව කටයුතු කරන ආයතනය සමුපකාර සේවක කොමිෂන් සභාවය. සේවකයන් කොන්ත්‍රාත් පදනමට බඳවාගැනීමේ දී මෙන්ම වැඩබැලීම සඳහා යම් තනතුරකට පත්කිරීමේදී ද සමුපකාර සේවක කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ. නමුත්, යම් සේවකයෙකු සඳහා වෙනත් තනතුරක වැඩ බැලීම සඳහා ලබාදෙන උපරිම කාලය මාස හයකි. නමුත්, මෙම සමිතියේ බැංකු සේවා කළමනාකරු තනතුරෙහි වැඩබැලීම කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව සාමාන්‍යාධිකාරීවරයා විසින් සිදුකරයි. මේ නිසා සාමාන්‍යාධිකාරී තනතුරට අදාල කාර්යයන් මෙන්ම බැංකු සේවා කළමනාකරු තනතුරේ කාර්යයන්ද මඟහැරී තිබෙන ආකාරය නිරීක්ෂණය විය. උදාහරණ ලෙස සමිතියේ ගොඩනැඟිලිවල නවීකරණ කටයුතු නිසිපරිදි සිදු නොවීම, පවත්වාගෙන යන ව්‍යාපාරික අංශ සියල්ල අලාභ ලබන තත්වයට පත්ව තිබීම දැකගත හැකිය. එමෙන්ම, පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නැවත සේවකයන් බඳවාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල දී තීරණ ලබාගෙන ඇතත් සේවකයන් බඳවාගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සමිතියේ සාමාන්‍යාධිකාරීවරයා අසමත්ව ඇත. තවද, ග්‍රාමීය බැංකු අංශයේ කටයුතුද නිසිපරිදි අධීක්ෂණය නෙවන බව නිරීක්ෂණය කරගත හැකිවිය. සමිතියේ තවත් ප්‍රධාන විධායක තනතුරක් ලෙස ගණකාධිකාරී තනතුර හඳුනාගත හැකිය. මෙම තනතුර සඳහා ද කොන්ත්‍රාත් පදනම මත සේවිකාවක් බඳවාගෙන ඇත. ඇය සමිතියේ ස්ථිර තනතුරක කාලයක් සේවය කර සේවයෙන් ඉල්ලාඅස්වී නැවත කොන්ත්‍රාත් පදනම මත සේවය කරයි. නමුත් සමිතියේ ගිණුම් කටයුතු යාවත්කාලීනව සිදුකර නොමැති බව ගිණුම් අංශයේ කටයුතු පිළිබඳ අවධානය යොමුකිරීමේදී නිරීක්ෂණය විය. සමිතියේ 2016/01/01 සිට 2016/12/31 දක්වා වූ ගිණුම්

වර්ෂයේ සිට අවසාන ගිණුම් සකස්කර විගණන කටයුතු සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර නැත. "Many people waste time on thinking how difficult the tasks at hand are waste another good part of it by telling they are busy to whoever they meet." (කමලදාස, 2010). නියමිත වේලාවට කළයුතු වැඩ කටයුතු නොකිරීම මත සමිතියේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු නොලැබීම නිරීක්ෂණය විය. නිවැරදි යාවත්කාලීන තොරතුරු නොලැබීම මත නිවැරදි තීරණ ගැනීමට මෙම තත්වය සෘජුවම බලපා ඇත. සමිතියේ දැනට සේවයේ යොදවා ඇති අනෙක් විධායක තනතුර ලේකම් තනතුරයි. මෙම තනතුර සඳහාද ස්ථිර සේවකයෙකු බඳවාගෙන නොමැත. මෙම තනතුරෙහි වැඩ බැලීම සිදුකරන්නේ වෙළඳසැල් සේවිකාවකි. යම් ආයතනයක සාර්ථකත්වය රඳා පවතින්නේ එම ආයතනය බඳවා ගන්නා මානව සම්පත මතයි. නමුත්, මෙම සමිතියේ අනෙකුත් විධායක නොවන තනතුරු වලින් වැඩි ප්‍රතිශතයක සේවකයන් වැඩබැලීමේ පදනමට හා පුහුණු වන සේවකයින් ලෙස සේවය කරනු ලැබේ. "Productivity starts by caring about all the resources. Labor is the most important out of all those resources" (කමලදාස, 2010). යම් ආයතනයක සම්පත් නිසිලෙස කළමනාකරණය කිරීම තුලින් එම ආයතනයේ ඵලදායීතාවය ඇතිකරගත හැකිය. ආයතනයක් සතුව පවතින සම්පත් අතුරෙන් වැදගත්ම සම්පත මානව සම්පතයි. මානව සම්පත සංවර්ධනය තුලින් අනෙක් සම්පත්වල ඵලදායීතාවයද වැඩිකරගත හැකි වේ. නාඋල විවිධ සේවා සමුපකාර සමිතිය සිය අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සමිතිය සතු භෞතික හා මානව සම්පත කාර්යක්ෂමවත් ඵලදායී ලෙසත් යොදා නොගන්නා බව ඉහත තොරතුරු තුලින් නිරීක්ෂණය වේ.

5. නිගමන

මෙම පර්යේෂණය සිදුකරන ලද්දේ විවිධ සේවා සමුපකාර සමිති තමන් සතු සම්පත් නිවැරදිව භාවිතා කරනවාද යන්න විමසීම සඳහාය. මෙම පර්යේෂණය තුළින් නිරීක්ෂණය වූයේ විවිධ සේවා සමුපකාර සමිති සතුව භෞතික හා මානව සම්පත් විශාල වශයෙන් පැවතියද එම සම්පත් උපයෝජනයෙ දී සමුපකාර ව්‍යාපාරයේ තිරසාර සංවර්ධනය සඳහා එම සම්පත් කාර්යක්ෂමවත් ඵලදායි ලෙසත් යොදා ගැනීම සිදුවී නොමැති බවයි. "ජපන් සමාගම්වල විශිෂ්ට සාර්ථකත්වය සඳහා බලපෑ කිසිදු රහස් මූල ද්‍රව්‍යයක් හෝ රහස් සංයෝගයක් හෝ නොමැත. ව්‍යාපාර සාර්ථකත්වයට යම් න්‍යායක් හෝ සැලසුමක් හෝ රාජ්‍ය ප්‍රතිපත්තියක් හෝ මත හට නොගනී. වඩා වැදගත් වූයේ ජපන් කළමනාකරුවන් විසින් සිය සේවකයන් සමග ඇතිකරගත් විශිෂ්ට සම්බන්ධතාව සමාගම තුළ සියළු දෙනා එක් පවුලක්ට අයත් පිරිසක් ය යන හැඟීම වර්ධනය කිරීම සහ සේවකයන් කළමනාකරුවන් හා සමාගම එකම ඉරණමක හවුල්කරුවන් ය යන හැඟීම දැනවීම යන කාර්යයන්ය" (රාජරත්න, 2014). ඒ අනුව, සමුපකාර ව්‍යාපාරයට විශේෂයෙන්ම එහි නායකත්වයට ප්‍රතිපත්ති සකස්කිරීමේ දී සමිති සතු සම්පත් උපයෝජනය සම්බන්ධයෙන් අවධානය යොමුවිය යුතු කරුණු කිහිපයක් පහත දක්වා ඇත. කෙසේවෙතත්, මෙම පර්යේෂණය සඳහා ශ්‍රී ලංකාව තුල විහිදී පවතින විවිධ සේවා සමුපකාර සමිති 306 න් එක් විවිධ සේවා සමුපකාර සමිතියක් පමණක් පාදක කරගෙන ඇති නිසා මෙම පර්යේෂණය පමණක් ප්‍රතිපත්ති සම්පාදන කාර්යයේදී සහයකර ගැනීම ප්‍රමාණවත් නැති බව සඳහන් කිරීමට අවශ්‍යය.

6. ප්‍රතිපත්තිමය ගම්‍යවීම්

පහත ප්‍රතිපත්තිමය ගම්‍යවීම් ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය සඳහා යොමුකරමි. පාරිභෝගිකයාගේ ගෙවන මුදලට වඩා වැඩි යමක් ඔවුන්ට ලබාදීමට හැකි දියුණු සමුපකාර ක්‍රමයක් සහිත ව්‍යාපාරයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම සඳහා ඒ ඒ ප්‍රදේශවල ප්‍රාදේශීය පරිසරයට අනුකූල සුවිශේෂී ව්‍යාපාරික අවස්ථා හඳුනා ගෙන ඒ ඔස්සේ ශක්තීන් හා දුර්වලතා මෙන්ම ඉදිරිපත්වී ඇති අවස්ථා හා අභියෝගද සලකා කළමනාකරණ ක්‍රම භාවිතා කර නිවැරදි ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සමුපකාර නායකත්වයට මඟ පෙන්වීම ද දැනට පවතින සාම්ප්‍රදායික ව්‍යාපාරික කටයුතු මත එල්බනොසිට නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා කටයුතු කිරීම හා නව අදහස් පෝෂණය කර ක්‍රියාත්මක කිරීම. ආයතනික වර්ධනයේ එක් එක් අවස්ථාවට අනුකූල උපාය මාර්ග තෝරා ගැනීම. ආයතනය පිරිවැය අඩු කර ගැනීම සඳහා සම්පත් වඩ වඩාත් කාර්යක්ෂම ලෙස භාවිතා කරන ආකාරය හඳුන්වා දීම, වැඩි වැඩියෙන් ප්‍රතිචක්‍රිකරණයට හුරුවීමත් මඟින් අනවශ්‍ය ලෙස සම්පත් නාස්ති නොකර සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට හුරු වීම. එමෙන්ම, විවෘත වෙළඳපළ තුළ සමුපකාර ව්‍යාපාරය නොනැසී පැවතීම සඳහා නියම මිලකට වෙළඳාම සිදු කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා සමිතිය සතු සම්පත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස භාවිතය තුළින් තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීමට සමිතියේ මානව සම්පත පුහුණුකිරීමත්, ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය කිරීමත් සුදුසු වේ. තවදුරටත්, දක්ෂ, නිර්මාණශීලී හා දැනුම පදනම් කරගත් අනුමානයන් ඔස්සේ තීරණ ගත හැකි සේවකයන් සමුපකාර ක්ෂේත්‍රයට ඇතුලත් කර ගැනීම සඳහාත්, එසේම විශේෂ පුද්ගලයන්ගෙන් සැදි කණ්ඩායමකට බොහෝ කාර්යයන් කළ හැකි බැවින් විෂම පුද්ගල කණ්ඩායම් මඟින් කාර්යය කර ගැනීමට හැම විටම ක්‍රියාකිරීම සුදුසු වේ. වර්තමානයේද කුඩා ව්‍යවසායකත්ව කණ්ඩායම් සමුපකාර ව්‍යාපාරය තුල ගොඩනැඟීම කාලෝචිතය. නිවැරදි සන්නිවේදන ක්‍රියාවලියක් ද ව්‍යාපාරය තුළ පවත්වා ගැනීම සුදුසු වේ. අයතනයේ පිරිසිදු බව පිලිවෙල හා ආකර්ෂණීය බව වැඩි දියුණු කර ගැනීම සඳහා ඵලදායිතා සංකල්ප භාවිතා කිරීම. සමුපකාර ව්‍යාපාරයේ තාක්ෂණය නිවැරදිව යොදා නොගැනීමෙන් වැඩ වැඩි වීමක් පමණක් නිරීක්ෂණය වේ. එම නිසා තාක්ෂණය වැඩ පහසු කිරීම සඳහා නිවැරදිව භාවිතා කිරීම ද අවශ්‍ය වේ.

ආශ්‍රිත මූලාශ්‍ර

අතපත්තු, ඩ. (2008). *ආර්ථික විද්‍යා ප්‍රවේශය.* මාතර: අතපත්තු ප්‍රකාශණ.

අබේසිංහ, ඒ. (2011). *සමුපකාරය ප්‍රජා සංවර්ධනය හා කාන්තා සහභාගිත්වය.* කොළඹ: ආරිය ප්‍රකාශකයෝ.

කමලදාස. (2010). *ඵලදායිතා ඉඟි.* කොලඹ.

කළුආරච්චි, ක. (2012). *ව්‍යවසායකත්වය හැඳින්වීම හා සිද්ධි අධ්‍යයනය.* මරදාන: ගොඩගේ සහෝදරයෝ පුද්ගලික සමාගම.

බුලත්ගම, අ. (2014). *සමුපකාරයට ප්‍රවේශයක්.* කොළඹ: ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.

රාජරත්න, එ. (2014). *ව්‍යවසායකත්වය හා කළමනාකරණය.* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය. (2015). *කළමනාකරණ ප්‍රතිසංස්කරණ සඳහා ඉදිරි දැක්ම.* කොළඹ: රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

වීරසුන්දර, එ. (1996). *කුඩා ව්‍යවසායකයා.* නුගේගොඩ: නිස්කෝ ප්‍රින්ටර්ස්.

ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය. (2020). *සමුපකාරික පාරිභෝගික සත්කාරය.* කොලඹ: ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. (2017). *සංඛ්‍යාන වාර්තාව.* කොළඹ: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව දකුණු පලාත. (2020). සමුපකාර සංවර්ධන දක්ෂිණ ශාස්ත්‍රීය සංග්‍රහය. *සමුපකාර සංවර්ධන දක්ෂිණ ජනලය*, 1-52.

හිදැල්ලආරච්චි, ස. (2007). *සංවර්ධන අධ්‍යනය.* කොලඹ: සරසවි ප්‍රකාශකයෝ.